බන්ධ/කො/චක්‍රලේඛ අංක- 27 /2010

මගේ අංකය-කෝ.01/02,
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09.
2010-09-13 වෙනි දින.

## සිරකරු සුභසාධක දිනය වෙනුවෙන් විශේෂ රාජ්‍ය සමාව- 2010-09-12

2010-09-12 වෙනි දිනට යෙදෙන සිරකරු සුභසාධක දිනය වෙනුවෙන් අතිගරු ජනාධිපති තුමා විසින් පහත දැක්වෙන පරිදි බන්ධනාගාර සිරදඬුවම් තියමව් ඇති සිරකරුවන් සඳහා පොදු සමාවක් ප්‍රදානය කර ඇත.

01. 2010-09-12 වෙනි දිනට සිරදඬුවම් විඳින, දඩමුදල් නොගෙවීම සම්බන්ධයෙන් බන්ධනාගාර ගතකරන ලද සිරකරුවන්ගේ ඉදිරියට ගෙවමින් පවතින දඬුවමේ ඉතිරි ශේෂය අහෝසි කිරීම.

02. 2010-09-12 වෙනි දිනට සිරදඬුවම ගෙවමින් සිටින වයස අවුරුදු 70 වැඩි සිරකරුවන්ගේ ඉදිරියට ගෙවමින් පවතින දඬුවමේ ඉතිරි ශේෂය අහෝසි කිරීම.

පහත දැක්වෙන වැරදි (වගන්ති) සඳහා සිරදඬුවම් විඳින සිරකරුවන්ට ඉහත සඳහන් අංක 01 යටතේ දක්වා ඇති විශේෂ සමාව හිමි නොවේ.

| | වරද | දණ්ඩනීති සංග්‍රහයේ වගන්ති |
|---|---|---|
| I. | නීති විරෝධී රුස්වීම | 140 සිට 142 සහ 146 |
| II. | මංකොල්ල | 380,382 සහ 383 |
| III. | ගෙවල් බිඳීම සහ රාත්‍රී කාලයේ ගෙවල් බිඳීම | 431,432,440,441ගෙවල් බිඳීම<br>443 සහ 446 රාත්‍රීගෙවල් බිඳීම |
| IV. | රාජ්‍ය ද්‍රෝහී ක්‍රියා | 114- 123 |
| V. | පැහැරගෙන යාම | 354 - 360 |
| VI. | අසභ්‍ය ප්‍රකාශන ළමුනට අදාල ප්‍රදර්ශනය | 286 A |
| VII. | ළමුනට හිංසා කිරීම | 308 A |
| VIII. | කුට්ටනය | 360 A |
| IX. | ළමයින්ගෙන් අයුතු ලෙස ලිංගික ප්‍රයෝජනය ගැනීම | 360 B |
| X. | තැනැත්තන් වෙළදාම් කිරීම | 360 C |
| XI. | දූෂණය කිරීම | 364 |
| XII. | ව්‍යාභිචාරය | 364 A |
| XIII. | අස්වාභාවික ( වැරදි ) | 365 |
| XIV. | පුද්ගලයින් අතර දැඩි අශිෂ්ට ක්‍රියා | 365 A |
| XV. | බරපතල ලිංගික අයථා ක්‍රියා | 365 B |
| XVI. | අල්ලස් පනත යටතේ වැරදිකරුවන් වුවත් | |
| XVII. | 1966 අංක 18 දරණ පීඩාකාරී ආයුධ පනතේ වැරදි | |
| XVIII. | ගිනි අවි ආඥා පනත යටතේ වැරදි | |

XIX. 1979 අංක 48 දරණ ත්‍රස්තවාදය මර්දන (තාවකාලික) විධි විධාන පනත යටතේ වැරදි

XX. 1982 අංක 24 දරණ ගුවන් යානා එරෙහි පනත යටතේ වැරදි

XXI. වස, අබිං සහ අන්තරායකර ඖෂධ ආඥා පනත

XXII. හදිසි නීතිය යටතේ වැරදිකරුවන් වූවන්

XXIII. ආදායම් බදු නඩු වල මුදල් ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් සිරදඬුවම් විඳින්නවුන්

XXIV. රේගු ආඥා පනත යටතේ වැරදිකරුවන් වූවන්

XXV. ඉහත අංක 01 සිට xxiv යටතේ දැක්වෙන වැරදි සම්බන්ධයෙන් යුධහමුදා පනත, නාවිකහමුදා පනත හෝ ගුවන් හමුදා පනත යටතේ යුද්ධාධිකරණය විසින් වැරදිකරුවන් කරනු ලැබූ අය.

ඉහත සඳහන් විශේෂ සමාව අදාල වනුයේ 2010-09-12 වන දින වනවිට සැබවින්ම බන්ධනාගාර ගතව සිටින සිරකරුවන් කෙරහි පමණි. මුදා හැරීම ක්‍රියාත්මක විය යුතු දිනය 2010-09-12 දින වේ.

එක් සිරකරුවෙකුට ඉහත සඳහන් විශේෂ රාජ්‍ය සමාවෙන් හිමිවිය යුත්තේ එක් වරප්‍රසාදයක් පමණි.

මෙම විශේෂ සමාව සම්බන්ධයෙන් යම් ගැටළු සහගත තත්වයක් ඇති වුවහොත් වැඩිදුරටත් මාගෙන් උපදෙස් ලබා ගැනීමට කටයුතු කරන්න.

විශේෂ සමාව යටතේ ඔබ ආයතනයෙන් මුදාහරිනු ලබන සිරකරුවන් සංඛ්‍යාව 2010-09-11 දින පෙ.ව. 10.00 ට පෙර දුරකතන පනිවුඩයක් මගින් හෝ ෆැක්ස් පනිවුඩයක් මගින් දැනුම් දි නිදහස් කිරීමෙන් පසු ලිපියක් මගින් විස්තර සහිතව සනාථ කරන්න.

බන්ධනාගාර කොමසාරිස් ජනරාල්.